# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2354/26 - 2023 ඔක්තෝබර් මස 20 වැනි සිකුරාදා - 2023.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DIVPW/LND/TANKD/LA/6/02 (පැරණි ගොනු අංකය 3/2/2/100).
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/12/2013/ED/631.

පුරන් වී ඇති වැකන්ද බැඳීම හා වානක් ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1326 කහටවිල ග්‍රාම නිලධාරි වසමේ, කිරිමැටියාගම ගමේ, කුරුණෑගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති අවසන් ගම් පිඹුරු අංක 1800හි, අතිරේක අංක 10, පත්‍ර අංකය 10හි පහත සඳහන් ඉඩම:

කැබලි අංකය 276

ඉඩමේ නම: මහවැවගාවහේන්යාය; හිමිකම් කියන අය: එස්. බී. වසන්ත උදයසිරි මහතා, කුලියාපිටිය පාර, හෙට්ටිපොල; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත, විවෘත මුඩුබිම සහ අවුරුදු 20 - 25ක් පමණ වයසැති පොල් ගස් 5ක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5221 (අක්කර 1, රූඩ් 1, පර්චස් 6.4).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ජනවාරි මස 10 වැනි දින පෙ.ව. 10.00ට පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2024 ජනවාරි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**අයි. පී. එන්. පී. තිලකරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
පඩුවස්නුවර - බටහිර.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0199

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: BND/LAND/ACQVI/W.B./3/1.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මස්විල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද ක.සි. 530284 සහ 2023.08.18 දිනැති කැඩස්තර සිතියමේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 1.0061 වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: දවටගහකනත්ත *හෙවත්* දවල්ගහකනත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 40-45ක් පමණ වයසැති රබර් වගාවක් ඇත; හිමිකම් කියන අය: විල්ලෝරගේ ලංකා නිශ්කානි චන්ද්‍රදාස, විල්ලෝරගේ වජිරා විදූමනි චන්ද්‍රදාස, විල්ලෝරගේ ෂාමනි පද්මා පෙරේරා, ඩබ්. එච්. ඩී. පෙරේරා, ඩබ්. එස්. එම්. පෙරේරා, ඩබ්. පියසිරි පෙරේරා සහ ඩබ්. ටී. යූ. චන්ද්‍රදාස; ප්‍රමාණය: හෙක්ටයාර් 1.0061ක් පමණ.

මායිම්:

*උතුරට*: ඩබ්. ටී. යූ. චන්ද්‍රදාස සහ තවත් අය, පී. ඩී. සී. පෙරේරා, කේ. කේ. ඩී. සිරිසේන, කේ. ඒ. විමලාවතී, එස්. ජයසූරිය, ටී. එන්. පෙරේරා, පී. ජේ. ප්‍රනාන්දු, එස්. ඩී. එස්. නිශාන්ත සහ ආර්. කොස්තා හිමිකම් කියන දවටගහකනත්ත *හෙවත්* දවල්ගහකනත්ත; *නැගෙනහිරට*: පී. ඩී. සී. පෙරේරා, කේ. කේ. ඩී. සිරිසේන, කේ. ඒ. විමලාවතී, එස්. ජයසූරිය, ටී. එන්. පෙරේරා, පී. ජේ. ප්‍රනාන්දු, එස්. ඩී. එස්. නිශාන්ත සහ ආර්. කොස්තා හිමිකම් කියන දවටගහකනත්ත *හෙවත්* දවල්ගහකනත්ත; *දකුණට*: මාර්ගය; *බටහිරට*: මාර්ගය, ඒ. කේ. රත්නායක, පී. අයි. සඳමාලි, පී. අයි. මදූශානි, ආර්. එන්. ෆොන්සේකා, ජී. බන්දුල හිමිකම් කියන දවටගහකනත්ත සහ ඩබ්. ටී. යූ. චන්ද්‍රදාස සහ තවත් අය හිමිකම් කියන දවටගහකනත්ත *හෙවත්* දවල්ගහකනත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ජනවාරි මස 26 වැනි දින පෙ.ව. 10.00ට බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2024 ජනවාරි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**දිස්නා ජයසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරගම.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.